4 වන පිටෙන්

සටන් විරාම නිරීක්ෂණ කමිටු ප්‍රධානී වුල්ෆ් හෙන්රික්සන් මහතා විශ්‍රාමලත් යුද හමුදා මේජර් ජනරාල්වරයෙක් මිස මරණ පරීක්ෂකවරයෙක්වත්, වෛද්‍යවරයෙක්වත්, මිනී කපන්නෙක්වත්, රෝහලක හෙද නිලධාරියෙක්වත් නොවේ. ඔහු ශ්‍රී ලංකාවට පැමිණියේ උතුරේ සටන් නිරීක්ෂණය කිරීමටය.
එසේ නොමැතිව උතුරේ යුද්ධයෙන් මියයන අය ගැන මරණ පරීක්ෂණ පවත්වා තීන්දු හා තීරණ ලබාදීමට නොවේ. නමුත් අද ඔහු කරන්නේ තමන්ට අයත් නැති එම කාර්යයි. මුතූර් නගරයේ මියගිය රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් 17 දෙනා සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව පිළිබඳ පිළිගත් නිශ්චිත පරීක්ෂණයක් නොපවත්වා ඔහු හමුදාව එයට වගකිව යුතු බවට ප්‍රකාශ කළේ එබැවිනි.
ඔහුගේ ක්‍රියාකාරීත්වය සම්පූර්ණයෙන්ම කොටි සංවිධානයට පක්ෂපාතී බව අමුතුවෙන් කිවයුතු නැත. ඒ බව පසුගිය අගෝස්තු මස 14 වැනිදා මුලතිව් පරන්තන් මාර්ගයේ පුදිකුඩිරප්පු, නගරයට දකුණින් පිහිටි ''සෙන්චෝලය'' ළමා කොටි යුද පුහුණු කඳවුරට ගුවන් හමුදාව එල්ල කළ ප්‍රහාරයෙන් අනතුරුව ඔහු හැසිරුණු ආකාරයෙන්ද මනාව වැටහේ.
එම කොටි පුහුණු කඳවුරේ සිටි 96 දෙනෙක් මිය ගොස් තවත් 232 ක් පමණ සුළු හා බරපතල තුවාල අතර එය කොටින්ගේ පුහුණු කඳවුරක් බව ප්‍රකාශ කිරීමට වුල්ෆ් හෙන්රික්සන් මහතා දැක්වුයේ මැලිකමකි. හෙන්රික්සන් මහතා යුද හමුදා නිලධාරියෙක් වශයෙන් යුද භූමිය පිළිබඳ හොඳ අවබෝධයක් ඇති පුද්ගලයෙකු වන්නට බැරි නැත.
එවැනි තත්ත්වයක් තුළ ගුවන් ප්‍රහාරයෙන් විනාශ වු ''සෙන්චෝල'' කඳවුර කොටින්ගේ පුහුණු මධ්‍යස්ථානයක් බවට ඔහුගේ නිරීක්ෂණයට හසු නොවුණේ ඇයි? එය මුතූර් සිද්ධිය මෙන් මරණ පරීක්ෂණ හෝ වෛද්‍ය පරීක්ෂණ කර සොයා ගතයුතු කරුණක් නොවේ. එය යුදමය කරුණකි. එම නිසා ''සෙන්චෝලය'' කඳවුර කොටින්ගේ යුද පුහුණු කඳවුරක්ද? නොඑසේ නම්, වෙනත් දෙයකට භාවිතා කරන දෙයක්ද? යන්න යුද භූමියේ වසර 30 ක පමණ අත්දැකීම් ඇති වුල්ෆ් හෙන්රික්සන් මහතාට සොයා ගැනීමට බැරිකමක් නැත. හෙන්රික්සන් මහතා එයවත් නොදන්න තොත්ත බබෙක් නම්, ඔහු හමුදාවේ මේජර් ජනරාල් නිලය දක්වා උසස්වීම් ලැබීම පවා පුදුම සහගතය.
සමහරවිට වුල්ෆ් හෙන්රික්සන් මහතාට එයවත් සොයා ගැනීමට බැරි නම්, ඔහුගේ හමුදා තනතුර සම්බන්ධයෙන්ද සැකයක් මතුවේ. එනම්, ශ්‍රී ලංකාවේ කළු කඩයකින් ඕනෑම අයෙකුට රුපියල් 500 ක් දී ''ආචාර්ය'' උපාධියක් ලබා ගැනීමට හැකියාව ඇතිවා සේ, හෙන්රික්සන් මහතාත්, නෝර්වේ කඩේකින් රුපියල් 500 ක් දී ''මේජර් ජනරාල්'' තනතුරක් ලබා ගත්තාද යන්නය.
සටන් විරාම නිරීක්ෂණ කමිටු ප්‍රධානියා ''මුතූර්'' සහ ''සෙන්චෝල'' සිද්ධීන් දෙකම යොදා ගත්තේ රජයේ ආරක්ෂක අංශවලට විරුද්ධව ජාත්‍යන්තර ප්‍රජාව උසි ගැන්වීමේ අරමුණිනි. ඉන් ඔහු දැනුවත්ව හෝ නොදැනුවත්ව ක්‍රියාවේ යෙදවුවේ ශ්‍රී ලංකාවේ වාසය කරන දෙමළ ජනතාව රජයේ හමුදාව මගින් විනාශ කරනවාය යන මතය ඇති කිරීම උදෙසාය.
නමුත් එය කොතෙක්දුරට සාර්ථක වූවාද? යන ප්‍රශ්නය මතුවේ. මන්ද, ''මුතූර් හා සෙන්චෝල'' සිද්ධීන් වලදී ඔවුන් ක්‍රියා කළ ආකාරය පිළිබඳව බොහෝදෙනාගේ විමතය පළවීමය. ඉන් ඔවුන්ගේ කාර්ය භාර්ය ජනතාව ඉදිරියේ හෑල්ලුවට ලක්වී ඔවුන්ව නිරුවත්වී ඇත.
''සෙන්චෝලය'' ළමා කොටි කඳවුරට ගුවන් හමුදාව පහර දුන්නේ නිකම්ම නොව, ඒ පිළිබඳව හොඳට තොරතුරු සොයා මනා අධ්‍යනයකින් පසුවය. නමුත් එය ළමා කොටි කඳවුරක් බවට රජයේ ආරක්ෂක අංශ පුන පුනා ප්‍රකාශ කළත් එය පිළිගැනීමට රාජ්‍ය නොවන සංවිධානය හෝ සටන් විරාම නිරීක්ෂණ කමිටු ප්‍රධානියා කැමැති වුයේ නැත. ඒ.ජා.ප.ය සිටියේද එම ප්‍රතිපත්තියේය.
නමුත් අද වනවිට එම මතය බිඳ දමමින් රජයේ හමුදාවේ මතය ජයග්‍රහණය කර ඇත. එම ජයග්‍රහණයට සහතික පත් සැපයුවේ හමුදාවෙන් නොව, කොටි සංවිධානය තුළින්මය. එනම් ''සෙන්චෝල'' ගුවන් ප්‍රහාරයෙන් තුවාල ලැබූ ළමා සෙබළියන් තිදෙනෙක්ව වැඩිදුර ප්‍රතිකාර සඳහා ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය මගින් රැගෙනවිත් දැනට මහනුවර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී.
ඔවුන් ''සෙන්චෝල'' කඳවුර ළමා කොටි පුහුණු කඳවුරක් බවට සනාථ කර සිටී. එම කඳවුරට ප්‍රහාර එල්ල කරන විට 500 පමණ පිරිසක් සිට ඇත. එයට ගැහැණු හා පිරිමි දෙපාර්ශ්වයම අයත් වේ.
දෙමව්පියන්ගේ විරෝධය නොතකා බලහත්කාරයෙන් සිය නිවෙස්වලින් රැගෙන ආ දරුවන්ට දින 14 ක අවි පුහුණුවක්ද ලබාදීමට නියමිතව තිබී ඇත.

''ආත්මාරක්ෂක සටන් කලාව'' යනුවෙන් ලබාදෙන එම පුහුණුවෙන් අනතුරුව සියලුදෙනාටම ''කාඩ්පතක් හෙවත් හැඳුණුම්පතක්'' ලබා දේ. අනතුරුව එම ''කාඩ්පත'' පාසැල්වල සහ පුද්ගලික පංති වල ඉගෙන ගැනීමටද අත්‍යවශ්‍ය දෙයක් බවට පත්වනු ඇත. එය නොමැති වුවහොත් ඉගෙනීමේ කාර්ය කිරීමේදී ප්‍රශ්න මතුවනු ඇත.
කොටි සංවිධානයේ ශිෂ්‍ය අංශය මගින් සිදුකරන ''සෙන්චෝලය'' කඳවුරේ මෙම පුහුණු වැඩ සටහන ආරම්භ කර දින දෙකකින් එයට ගුවන් හමුදාව ප්‍රහාර එල්ල කර ඇති බව තුවාල ලබා මහනුවර රෝහලේ ප්‍රතිකාර ලබන දරුවන් තිදෙනා ප්‍රකාශ කර සිටී.
සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ අයටත් වඩා, රජයේ ආරක්ෂක අංශ හෝ සමාජයේ සෙසු පිරිස් වලටත් වඩා, එම කඳවුරේ සිදුවුණේ මොනවදා? එය කාට අයත් කඳවුරක්ද? එහි ළමයින් බලහත්කාරයෙන් රැගෙන ආ අයද? නැද්ද? යනාදී කරුණු පිළිබඳව හොඳට දන්නේ එහි සිටි අයයි. එසේනම්, එහි සිට තුවාල ලබා රෝහලේ ප්‍රතිකාර ලබන අය කියන්නේ බොරු නොව, සත්‍යය සිද්ධියයි. එයට අභියෝග කිරීමට රාජ්‍ය නොවන සංවිධානවලට හෝ සටන් නිරීක්ෂකයන්ට හෝ වෙනත් බලවේගයකට හැකියාවක් නැත. මන්ද, සත්‍යය කතාව දන්නේ ඔවුන් වන බැවිනි.
මෙයට අප කව්රුවත් කලබල වියයුතු නැත. සටන් විරාම නිරීක්ෂණ කමිටු ප්‍රධානී මේජර් ජනරාල් වුල්ෆ් හෙන්රික්සන් මහතාගේ බොරුවලට නිසි පිළිතුරු දැනටමත් ලැබී ඇත. ඊටත් නිරීක්ෂණ කමිටු ප්‍රධානියා ශ්‍රී ලංකාවේ නිරීක්ෂණ කටයුතු භාර ගත්තේ පසුගිය අප්‍රේල් මස පළමු වැනිදාය. එදින මෝඩයාගේ දිනයයි. එසේනම්, මෝඩයාගේ දිනයේ වැඩ භාරගත් සටන් විරාම නිරීක්ෂණ කමිටු ප්‍රධානියාගේ මෝඩ වැඩ පිළිබඳව ශ්‍රී ලංකාවේ උගත් බුද්ධිමත් ජනතාව එතරම් කලබල වියයුතු නැත. මන්ද, මෝඩ මිනිසුන්ගේ ස්වභාවය එය වන බැවිනි.

නමුත් ප්‍රශ්නය ඇත්තේ එතන නොව, මෝඩ මිනිසුන්ගේ මෝඩ වැඩ නිසා අමාරුවේ වැටෙන්නේ අහිංසක අසරණ මිනිසුන් බැවිනි. මෙවැනි මෝඩයින් රටින් පැන්නිය යුත්තේ එබැවිනි.

ශ්‍රී ලාල් ප්‍රියන්ත

32 පිටෙන්

බලාපොරොත්තුවත් දරුවා දැකීමේ ආශාවත් ඔහු තුළ නොතිබුණා නොවේ. කවදා හෝ තම දරුවාගේ පියා දරුවා බැලීමට එයිදෝ යන සිතුවිල්ල නිසා යවන සුළු මුදලින් හෝ සුළු වශයෙන් ඉස්කෝලෙ මහත්මයාගේ මහගෙදර අසලින්ම තවත් නිවසක් ඉදිවෙමින් තිබුණි.
මේ අතර කැදලි කීපයක් විනාශ කර දැමූ කොටිටෝරුවාට එය දැන් සාමාන්‍ය දෙයක් වෙලා. සමහර කැදලි සුනු විසුනු වී ගියත් සමාජ විලි ලැජ්ජාවෙන් බේරී සිටීමට සමහර කුරුල්ලන් කැදැල්ලෙන් පිටට ඒ වේදනාව දුන්නෙ නැත. ඒත් තවමත් කොටිටෝරුවාගේ ගුණ වර්ණනා කල කිරිල්ලියෝ නොසිටියා නොවේ.

ජාතියක් ජම්මයක් පාටක් නොපාටක් නොතකා කොටිටෝරුවා තම ව්‍යාපාරය දිගටම කරගෙන ගියේය. එක් දිනක අධික ලෙස මත් වූ කොටිටෝරුවා හා රෑන මෙවර පිවිසියේ මුහුදු තීරයේ සිටි සුදු කිරිල්ලියෙක් තමන්ගේ ග්‍රහණයට ලබා ගැනීමට. තවදුරටත් මත්පැන් පානය කරමින් කිරිල්ලිය දූෂණය කළේ හූ කියමින්. කොටිටෝරු රෑනට තම මනදොල සංසිඳෙන තෙක් කොක් හඬ ලමින් විනෝද විය. කොක්හඬ ලමින් තමාගේ වාහන වලට නැගගත් ඔවුන් විදුලි වේගයෙන් එතැනින් ඉවත් වුණේ ඈතින් එන පුද්ගලයෙක් දැකීමෙන් පසුවයි. මේ අතර ඔත්පල වී සිටි කිරිල්ලිය අසල රෝහලකට ඇතුළු කර, පොලිස් නිලධාරීන් ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමට පටන් ගත්තා. ඔත්පල වී සිටි ඇයගේ ජංගම දුරකතනයත් මුදල් පසුම්බියත් නැති වී ඇති බව දැන ගැනීමටත් ඇය දූෂණය කර ඇති බවත් සැක කිරීමට පොලිසියට වැඩි වේලාවක් ගත නොවිය. ඔවුන් ඒ පිළිබඳ කටයුතු අදාළ ආයතන වලට දැනුම් දුන්නත් ඒ පිළිබඳ යමක් කිරීමට හෝ පුද්ගලයෙක් සොයා ගැනීමට නොහැකි විය.
කාලය කෙමින් ගතවිය. සුපුරුදු අංතනය අනුව ධර්මේ ජීවිතය ගෙවිනි. හදිසියේ රේණුකාට ධර්මෙගෙන් දුරකතන ඇමතීමක් ලැබිණ.
"ඉතිං කොහොමද දැන් ගෙදර වැඩ කටයුතු"
"බොහෝ දුරට ඉවරයි." " ඉතින් කවදද ඔයා ගෙදර එන්නෙ. දැන් දරුවත් ලොකුයි. එන අවුරුද්දේ ඉස්කෝලෙ යනවා. ඉන්නකෝ ගෙදර වැඩ ටික ඉවර වුනහම එනවා. ගෙදරට බඩු ටිකක් ගන්නත් එපායැ." ඊට පස්සෙ හොඳ වාහනයකුත් ගන්න ඕනෑ. තව ටික කාලයක් ඉමු" හුගක් වෙලා කථා කලා නේද? ඔයාගේ බිල යනවා නේද? නෑ කමක් නෑ පැකිලීමක් නැතිව ධර්මේ රේණුකා සමඟ නොයෙක් දේ ගැන, ඉදිරි බලාපොරොත්තු ගැන කථා කළා. ඒත් මීට පෙර ඉතා කෙටි වේලාවක් දුරකථනයෙන් කථා කරන ඔහු අද මෙච්චර වෙලාවක් ඇය සමඟ කතා කරන්නේ ඇයි දැයි ඇයට නොසිතුණා නොවේ. දැන් තිව්වා නම් හොඳයි නේද? ඔයා බීලා නේද? නෑ කමක් නෑ තව ටිකකින් කොහොමත් ජ්කක එක කට් වේවි. එතකම් කතා කරමු." "හනේ මන්දන්නෙ නෑ" ධර්මේ හදිසියේ කථාව නැවැත්වූ නිසා "ධර්මේ ධර්මේ" මොකද කථාව නැවතුනේ.
"නෑ කව්ද දොරට තට්ටු කරනවා, ඉන්න මම බලලා එන්නම්" දොර අරිනවාත් සමඟ ඇතුළට පැනගත් පොලිස් නිලධාරීන් ධර්මේ අත්අඩංගුවට ගත්තා. සිදුවීම සිදුවී මාස ගණනක් ගතවූවත් මෙය මෙසේ වූයේ කෙසේදැයි ඔහුටවත් දැන ගැනීමට නොහැකි වුණා. ඇඳ උඩ තිබූ ජංගම දුරකතනය අතට ගත් පොලිස් නිලධාරීන් ඔහු දෙසට හැරෙනවාත් සමගම ඔහුට තරු විසි විය. ජංගම දුරකතනයේ හිමිකාරිය ඔවුන් විසින් හිංසාවට පත් කළ තරුණියගේ බවත් එය විසංදි නොකිරීමට පොලිසිය වගබලා ගත් නිසාත් ධර්මේගේ ඉරණම අද විසඳිනි.

තම සගයා අත්අඩංගුවට ගත් බව දැනගත් ඔවුන්ගේ මිතුරන් වහාම රටින් පැන ගත්තා. මේ අතරතුර නොයෙක් ආකාරයේ පරීක්ෂාවලට ලක් කළ ධර්මේට බේරීමට තිබීම ඉඩක් නොමැති විදියට තදකර තිබීමට පොලීසිය නොපසුබට වූයේ නැත. අද කොටිටෝරුවට හිමි වී ඇත්තේ සිර මැදිරියක්. කොටිටෝරුවා සුරතල් කළ කිරිල්ලියන් එහි නැත. කැබැලි වූ කූඩු තවමත් කැබැලි වී ඇත. රේණුකා දරුවා සමඟ පාසල් ගෙන යයි. කොටිටෝරුවාගේ දෙමව්පියන් මිය ගොස් ඇත. නිවස ඉදිකිරීම් නැවතී ඇත. තවත් කොටිටෝරුවෙක් රේණුකාගේ නිවස අසලින් පියාසර කරන්නේද කියා කවුරුවත් නොදනී.